# වයඹ පළාතේ පළාත් සභාවේ
## 1998 අංක 3 දරන වයඹ සමූපකාර සංවර්ධන පදනම ප්‍රඥප්තිය.

( වයඹ ආණ්ඩුකාර වරයා අනුමත කළ දිනය : 2002.10.04 )

වයඹ පළාතේ සමුපකාර ව්‍යාපාර හා ව්‍යාපෘති කටයුතු ද, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් ද කාර්යක්ෂම හා ඵලදායී ලෙස සංවර්ධනය කිරීම සඳහා වයඹ සමූපකාර සංවර්ධන පදනම පිහිටුවීම පිණිස ද, එයට අදාළ වූ නැතහොත් ආනුෂංගික වූ කරුණු ගැන විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 3 දරන වයඹ සමූපකාර සංවර්ධන පදනම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය

2. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

## 1 වන කොටස.

### වයඹ සමූපකාර සංවර්ධන පදනම සංස්ථාපනය.

වයඹ සමූපකාර සංවර්ධන පදනම.

3. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා වයඹ සමූපකාර සංවර්ධන පදනම යනුවෙන් නම් කෙරෙන පදනමක් පිහිටවනු ලැබිය යුත්තේ ය.

පදනම නීතිගත සංස්ථාවක් බව.

4. පදනම අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද, දේපළ, ඉඩකඩම්, වාහන, යන්ත්‍රෝපකරණ හා උපකරණ සන්තකයට ගැනීමට ද, හිමිකම් ලැබීමට ද, ඒවා නියාදනය කිරීමට ද, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන සියළු කාර්යයන් කිරීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත් වන්නේ ය.

**සංයුතිය හා නිල කාලය**

5. (1) මින්මතු "පාලක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයක් පදනම සඳහා තිබිය යුතු අතර, එම මණ්ඩලය මෙහි දෙවැනි උප වගන්තියේ දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත්කළ යුතු ය.

(2) පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

(අ) පළාත් සමුපකාර අමාත්‍යංශයේ ලේකම්වරයා.

(ආ) පළාත් සභාවේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙක්.

(ඇ) පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා.

(ඈ) වයඹ පළාත් සමුපකාර මහා සංගමයේ සහ පළාත් ග්‍රාමීය බැංකු සංගමයේ සභාපතිවරුන් දෙදෙනා.

(ඉ) වයඹ පළාතේ දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සභාපතිවරුන් තිදෙනා.

(ඊ) පළාත් සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙක්.

(3) පාලක මණ්ඩලයේ නිල කාලය වසර තුනක් විය යුතු අතර, නිල කාලය අවසන් වීමෙන් පසු, තනතුරෙන් ඉවත්ව යන සාමාජිකයන් ඔවුන්ගේ කැමැත්ත අනුව, අමාත්‍යවරයා විසින් නැවත පත්කරනු ලැබිය හැකි ය. නිල තනතුරු හේතුවෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයන් වන තැනැත්තන්ගේ සාමාජිකත්වය නිල තනතුර අවසන් වන විට අහෝසි විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කිරීමෙන් තම ධූරයෙන් ඉවත් විය හැකි ය. යම් සාමාජිකයකු ඉවත් කිරීම අවශ්‍යයැයි අමාත්‍යවරයාට හැඟී යන්නේ නම්, එම සාමාජිකයා පාලක මණ්ඩලයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති අතර, එසේ ඉවත් වන හෝ ඉවත් කරනු ලබන සාමාජිකයකු වෙනුවට වෙනත් අයකු පත්කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන සාමාජිකයාගේ නිල කාලය පූර්වයෙන් සිටි සාමාජිකයාගේ ඉතිරි නිල කාලය වන්නේ ය.

නුසුදුසුකම් 6. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත්පාලන ආයතනයක සභිකයකු හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි.

පදනමේ සභාපති 7. (1) සමූපකාර විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා නිල බලයෙන් පදනමේ ද සභාපති වන්නේ ය.

(2) පදනමේ සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු අතර, විශේෂිත හේතුවක් මත ඔහු නොමැත්තේ නම් පමණක් තාවකාලිකව තෝරා ගන්නා අයකු මණ්ඩලයේ මූලසුන දැරිය යුතු වන්නේ ය.

මණ්ඩලයේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික. 8. වයඹ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සමූපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට හා ප්‍රමාණ වලට අනුව මණ්ඩලයේ සභාපතිට හා සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

## II කොටස

### පදනමේ පරමාර්ථ හා කාර්ය භාරය

පදනමේ පරමාර්ථ. 9. වයඹ පළාතේ සමූපකාර ව්‍යාපාරයේ ඵලදායිත්ව සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

පදනමේ කාර්ය භාරය. 10. (1) වයඹ පළාතේ සමූපකාර ව්‍යාපාරය කාර්යක්ෂම හා ඵලදායි කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මානව සම්පත් හා කළමනාකරණ සේවා ආයතනයක් පිහිටුවීම හා ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම හා එම කාර්යයන් වැඩිදියුණු කොට පවත්වාගෙන යාම.

(2) සමුපකාර සංවිධාන මගින් දේශිය කෘෂි ද්‍රව්‍ය හා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය, මිලදී ගැනීම හා අලෙවි කිරීම පිළිබඳ සංවිධාන කටයුතු කිරීම හා මූල්‍යාධාර සැපයීම.

(3) පදනමේ පරමාර්ථ සපුරා ගැනීම පිණිස ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව, දේශිය හෝ විදේශිය හෝ සංවිධාන සමඟ හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම, ආනයන හා අපනයන කටයුතු හා අදාල සේවාවන් ලබා ගැනීම ආදී කටයුතු සඳහා ගිවිසුම් වලට හෝ සහයෝගිතා ගිවිසුම් වලට හෝ එළඹීම.

(4) පදනමේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යයන පාඨමාලා හා දේශන වලට අනුග්‍රහ දැක්වීම හා සහභාගි වීම.

(5) සමුපකාර අධ්‍යාපනය, කළමනාකරණ හා ව්‍යාප්ති කටයුතු ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය ශිෂ්‍යත්ව, ත්‍යාග, මූල්‍යාධාර හා වෙනත් ආකාරයෙන් වූ ආධාර ප්‍රදානය කිරීම.

(6) සමුපකාර ප්‍රතිපත්ති වලට අනුව ප්‍රජාවගේ හා සමුපකාර සමිති සාමාජිකයන්ගේ සාමාජයීය හා ආර්ථික තත්ත්වය දියුණු කරලීම පිණිස වන ග්‍රාමීය කර්මාන්ත, ස්වයං රැකියා ව්‍යාපෘති, සමුපකාර ගම්මාන ආදි අදාල ව්‍යාපෘතීන් සැලසුම් කිරීම, පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මූල්‍යාධාර සහ උපදේශක සේවාවන් සැපයීම.

(7) සමුපකාර සංවිධාන වල සාමාජිකයන්ගේ හා සේවකයන්ගේ පවුල්වල අය යම් ව්‍යාපෘතියකට හෝ රැකියාවකට පුහුණු කිරීම හා නිරත කිරීමේ අවස්ථා සැලසීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය, සහාය දීම හා ආධාර කිරීම.

(8) සමුපකාර ප්‍රජාවගේ අධ්‍යාපනික, සමාජයීය හා සංස්කෘතික සංවර්ධනය සැලසීම සඳහා ඉවහල් වන ප්‍රදර්ශන, සංදර්ශන, සංසද සහ ප්‍රචාරණ සේවා සංවිධානය කිරීම හා මෙහෙයවීම.

(9) සමූපකාර සමිති සාමාජිකයන් හා සේවකයන්ගේ ද, සමූපකාර සේවයේ නියුක්තිකයන්ගේද, හදිසි ආපදා හා සුබසාධනයට අදාළ සහන සැලසීම හා පාලක මණ්ඩලය තීරණය කරනු ලබන වෙනත් සුබසාධක කටයුතු සඳහා ආධාර සැපයීම.

(10) පදනමේ ප්‍රවර්ධනය සඳහා යෝග්‍ය යැයි පදනම විසින් තීරණය කරනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර හා සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, මිලදී ගැනීම හා බෙදා හැරීම, වෙනත් සංනිවේදන මාධ්‍ය යොදා ගැනීම.

## III කොටස

## පදනමේ බලතල

**පදනමට බලතල තිබිය යුතු බව.**

11. (1) පදනමේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන යම් නිශ්චල හෝ චංචල දේපලක් මිලයට ගැනීම හෝ අන් අයුරකින් සන්තකයට ගැනීම, දැරීම හා බදු හෝ කුලියට දීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීමට පදනමට බලය ඇත්තේ ය.

(2) බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ සහ වැසීමේද, ඇප ඇතිව හෝ ඇප නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද, සම්මාදම් මුදල්, ආධාර මුදල් හෝ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ සහ පදනමේ පරමාර්ථ ඉටුකරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් අස්කිරීමේ ද බලය ඇතුළුව පදනමේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියළු කාර්යයන් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය පදනමට ඇත්තේ ය.

(3) පදනමේ පරමාර්ථ සාධනය කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන හෝ සියළුම කාර්යයන් ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය පදනමට ඇත්තේ ය.

**මණ්ඩල රැස්වීම.**

12. (1) පදනමේ මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වරක් හෝ රැස්විය යුතුය. විශේෂ හෝ අත්‍යවශ්‍ය යයි හැඟී යන අවස්ථාවකදී මණ්ඩලයේ රැස්වීමක් කැඳවීමට සභාපතිවරයාට බලය ඇත.

(2) මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙස අවම වශයෙන් එහි සාමාජිකයන් දෙකෙන් කොටසකට වැඩි සංඛ්‍යාවක් ඉල්ලා සිටියහොත්, එම ඉල්ලීම ලැබී දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම සඳහා ගණපූරණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් පස් දෙනකු වේ.

(4) මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණයක් ගැනීමට ඇති කරුණු මණ්ඩලයේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය. කැමැත්ත විමසීමේ දී පක්ෂව හා විපක්ෂව ලැබුණ ඡන්ද සංඛ්‍යාව සමවේ නම්, සභාපතිවරයාට හෝ මූලාසනය දරන්නාට හෝ තමන්ගේ ඡන්දය තීරක ඡන්දයක් ලෙස භාවිතා කළ හැකි ය.

(5) මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිණිස මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව, මණ්ඩලය විසින් සිය කාර්ය පරිපාටිය සකස් කරගත හැකි ය.සියළුම රැස්වීම් වාර්තා හා තීරණ ලේඛනයක සටහන් කර පැමිණි සාමාජිකයින් අත්සන් කළ යුතු ය.

(6) මණ්ඩලයේ සභාපතිවරයාගේ හෝ යම් සාමාජිකයකුගේ හෝ පත්වීමක දෝෂයක් නිසා මණ්ඩලය ගනු ලබන තීරණයක් හෝ කරුණක් හෝ බල රහිත නොවිය යුතු ය.

**මණ්ඩලයේ කාර්යයන්.**

13. (1) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වගකීම්, කාර්යයන් හා බලතල පදනමේ ඕනෑම සාමාජිකයකුට හෝ සේවකයකුට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් කාරක සභා, උපකාරක සභා සහ උපදේශක මණ්ඩල පත්කරනු ලැබිය හැකි අතර, විශේෂ විෂයයක් හෝ වගකීමක් හෝ කාර්යයක් හෝ ඒවාට පවරනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) සහ (2) උප වගන්ති යටතේ බලතල පවරනු ලැබූ අයකු හෝ කණ්ඩායමක් හෝ මණ්ඩලයේ පොදු හෝ නිශ්චිත නියමයකට යටත්ව, තමන් වෙත පැවරුණු බලතල වගකීම් හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කළ යුතු ය.

(4) කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තිරණය කිරීම මණ්ඩලය විසින් කළයුතු අතර, කාර්ය මණ්ඩලයේ වේතන හෝ වෙනත් පාරිශ්‍රමික හෝ නියම කිරීම ද මණ්ඩලය විසින් කළ යුතු ය.

(5) බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම, පත්කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියාකිරීම පිළිබඳ විධිවිධාන හා කාර්ය පරිපාටි මණ්ඩලය විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය.

**ලේකම්වරයකු හා කාර්ය මණ්ඩලයක් පත් කිරීම.**

14. මෙම ප්‍රඥප්තියෙහි ලේකම්වරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණකාලීන සේවකයකු මණ්ඩලය විසින් පත් කළ යුතුය. ඊට අමතරව පදනමේ කාර්යයන් පවත්වාගෙන යෑම සඳහා ඉහත 13 වැනි වගන්තියට යටත්ව අවශ්‍ය කාර්ය මණ්ඩලයක් පත් කිරීමට ද මණ්ඩලයට බලය ඇත.

**කාර්ය මණ්ඩලයට බලතල පැවරීම.**

15. පදනමේ ලේකම්වරයාගේ හා කාර්ය මණ්ඩලයේ කාර්යභාරය පදනම විසින් තිරණය කළයුතු අතර, ලේකම්වරයාගේ කාර්යභාරයන් සභාපතිවරයා විසිනුත්, සෙසු කාර්ය මණ්ඩලයේ කාර්ය භාරයන් ලේකම්වරයා විසිනුත් එම අයවළුන් වෙත පැවරිය යුතු ය.

ලේකම් වරයාගේ බලතල හා වගකීම්.

16. (1) — -ලේකම්වරයා මණ්ඩලයේ ලේකම් විය යුතු අතර, මණ්ඩල රැස්වීම් වලදී මහුට ඡන්ද බලය හිමි නොවේ.

(2) පදනමේ එදිනෙදා සියළුම පරිපාලන කටයුතු පිළිබඳව ලේකම්වරයා වගකිව යුතු වේ. මෙම පදනම වෙනත් විධිවිධාන වලට යටත්ව ;

(අ) පදනම විසින් සේවයේ යොදවාගෙන ඇති අයගේ කුසලතා වර්ධනය.

(ආ) පදනමේ කාර්යක්ෂමතාවය හා පදනමේ පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහි ලා, ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.

(ඇ) පදනමේ අරමුණ සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම.

මහුගේ වගකීම් වලට ඇතුලත් විය යුතු ය.

(3) මෙයට අමතරව මණ්ඩලය විසින් ලේකම්වරයාට පවරනු ලැබිය හැකි කාර්යයන් හා කටයුතු ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම මහු කල යුතු ය.

## IV වන කොටස

## අරමුදල් හා විගණනය.

පදනමේ අරමුදල.

17. පදනමට අරමුදලක් තිබිය යුතුය. එය ;

(අ) පදනමේ අරමුදල සඳහා වයඹ පළාත් සභාව විසින් වරින් වර ලබාදෙන මුදල්.

(ආ) සමුපකාර අරමුදලෙන් ලැබෙන ප්‍රදාන.

(ඇ) පරිත්‍යාග, ආධාර මුදල් සහ ණය.

(ඈ) ප්‍රදර්ශන, අලෙවි සැල්, ලොතරැයි හෝ එවැනි කටයුතු වලින් ලැබෙන මුදල්.

(ඉ) උපලබ්ධිත ලාභ හෝ පොලී මුදල්.

යන ආකාර වලින් පදනම සඳහා ලැබෙන මුදල් පදනමේ අරමුදලට බැර කළ යුතු ය.

**මුදල් ගෙවීම**

18. පදනම සඳහා ලැබෙන මුදල් වෙනුවෙන් වෙනම ගිණුමක් හෝ ගිණුම් කිපයක් පවත්වාගෙන යා යුතු ය. මුදල් ගෙවීමට අදාල චෙක්පත් හා ගෙවීම් ලේඛන සභාපතිවරයා සහ ලේකම්වරයා යන දෙදෙනාම අත්සන් කළ යුතු ය.

**අරමුදල් යෙදවීම.**

19. පදනමේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම පිණිස පාලක මණ්ඩලයේ අනුමතිය පරිදි අරමුදල යොදාගත හැකි ය.

**පදනමේ ගිණුම්.**

20. එක් එක් අරමුදල් වර්ෂය වෙනුවෙන් සිය ආදායම් සහ වියදම් පිළිබඳවත්, වෙනත් සියළු ගණුදෙනු පිළිබඳවත්, නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සම්පාදනය කළයුතු අතර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා තිරණය කරනු ලබන තොරතුරු ද ඇතුලත් කොට, සිය ව්‍යාපාරයට අදාලව ගිණුම් ඇතුලත් වාර්ෂික ප්‍රකාශයක් මණ්ඩලය විසින් පිළියෙළ කළ යුතු ය.

**පදනමේ මුදල් වර්ෂය.**

21. පදනමේ මුදල් වර්ෂය ජනවාරි මස පළමුවෙනි දින සිට දෙසැම්බර් මස තිස්එක් වැනි දින දක්වා වේ.

**පදනමේ ගිණුම් විගණනය.**

22. (1) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් පදනමේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු ලවා විගණනය කළ යුතු ය. මණ්ඩලය විසින් වාර්ෂික ගිණුම් වාර්තාවක් ප්‍රසිද්ධ කළ යුතු ය.

(2) පදනමේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය උදෙසා දරන ලද වියදම් පියවීම් සඳහා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික මුදලක් පදනමේ අරමුදලින් ගෙවිය හැකි ය.

(3) මෙම වගන්තියේ කාර්යයන් උදෙසා සුදුසුකම් ලත් විගණකවරයා යනුවෙන් අදහස් වනුයේ ;

(අ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විගණකවරයකු,

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වූද, එම ආයතනය විසින් ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූද තැනැත්තකු හෝ

(ඇ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි වරුන්ගේ ආයතනයේ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරි වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් වේ.

විගණන වාර්තාව හා පදනමේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව.

23. විගණනය කරන ලද ගිණුම් වාර්තාව එක් එක් වර්ෂය වෙනුවෙන් ලද විට, එම වාර්තාවට අදාළ මුදල් වර්ෂය තුළදී පදනම විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද සමඟ එම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එම ගිණුම් වලට අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස් මසක් ඉකුත් වීමට පෙර, ඒවා අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

## V වන කොටස

## විවිධ කරුණු

පදනමේ පොදු මුද්‍රාව.

24. (1) පදනම සඳහා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය පදනමේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයාත්, පදනමේ ලේකම්වරයාත් ඉදිරියේ දී හැර, පදනමේ පොදු මුද්‍රාව යම් සාධන පත්‍රයක හෝ ලියවිල්ලක හෝ නොයෙදිය යුතු අතර, පෙර කී නියෝජිතයන් දෙදෙනා ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතු ය.

(3) පදනමේ පොදු මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයට උපදෙස් දීම.

25. සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා රාජකාරියෙහි සිය වගකීම් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට දෙනු ලැබිය හැකි පොදු හෝ නිශ්චිත හෝ උපදෙස් වලට යටත්ව, ක්‍රියා කිරීමට මණ්ඩලය බැඳී සිටී.

නියෝග සෑදිය හැකි බව.

26. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියෝග පැනවිය යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහාත්, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ගැසට් පත්‍රයේ පළවීමෙන් පසු, හැකිතාක් ඉක්මණින් අනුමතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතු ය. ඒ අයුරින් අනුමත කරනු නොලැබූ නියෝගයක් වෙතොත්, එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළා සේ සැලකිය යුතු වුවත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතු ය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් මේ අයුරින් අවලංගු වූවා සේ සැලකිය යුත්තේ කවර දිනක සිට ද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

පදනමේ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකීම.

27. දණ්ඩනීති සංග්‍රහයේ සඳහන් අර්ථානුකූලව පදනමේ සියළුම සේවකයන් " රාජ්‍ය සේවකයන් " ලෙස සැලකිය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

28. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

29. මෙම ප්‍රඥප්තියෙහි අන්‍ය ආකාරයකින් සඳහන් වුවහොත් මිස,

" පළාත් සභාව " යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

" අමාත්‍යවරයා " යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ සමූපකාර විෂය භාර අමාත්‍යවරයා ද,

" කොමසාරිස්වරයා " යන්නෙන් වයඹ පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයා ද,

" අරමුදල " යන්නෙන් වයඹ සමූපකාර සංවර්ධන පදනම අරමුදල ද,

" පදනම " යන්නෙන් වයඹ සමූපකාර සංවර්ධන පදනම ද,

" මණ්ඩලය " යන්නෙන් වයඹ සමූපකාර සංවර්ධන පදනමේ පාලක මණ්ඩලය ද,

" සමූපකාර සමිති " යන්නෙන් සමූපකාර සමිති වලට අදාළ නීතිය යටතේ ලියා පදිංචි කරන ලද සමිතියක් ද,

" සමූපකාර සංවිධාන " යන්නෙන් ලියාපදිංචි සමූපකාර සමිතියක් සංගමයක් ද,

" සාමාජිකයා " යන්නෙන් සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සහභාගි වන තැනැත්තෙක් ද, ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු සමූපකාර සමිති වලට අදාළ නීතිය හා අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කර ගන්නා තැනැත්තකු ද,

" සේවකයා " යන්නෙන් සමුපකාර සමිති-වලට අදාල නීතිය යටතේ ලියා පදිංචි කරන ලද සමිතියක වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූලව සේවකයකු වශයෙන් සලකනු ලබන තැනැත්තකු ද,

අදහස් කරනු ලැබේ.